**විෂයයඃ- සිංහල භාෂාව හා සාහිත්‍යය**

**ශ්‍රේණිය ඃ- 11**

**වාරය ඃ- 02**

**ඒකකය ඃ- සමාස**

**ඉගෙනුම් පල ඃ-**

- සමාස නම් කරයි.
- විවිධ ක්‍රම යටතේ පද සමාස වන අයුරු විස්තර කරයි.
- පද සමාස කර දක්වයි.
- අවබෝධයෙන් යුතු ව සමාස භාවිත කරයි.

## ක්‍රියාකාරකම i.

1. සම්පූර්ණ කරන්න.




2. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. පද එක් කිරීම සමාසය යි.
ii. පද අතර වූ අකුරු මිශ්‍ර කිරීම සමාසය යි.
iii. පද කීපයක් කෙටි කොට ගැනීමෙන් එක් පදයක් බවට පත් කිරීම සමාසය යි.
iv. සමාස යනු පද සන්ධි කිරීමයි.

3. සම්පූර්ණ කරන්න.



## ක්‍රියාකාරකම ii

1. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

   i. අව්‍යය පද යනු නාම පද හා ක්‍රියා පදයි.
   ii. අව්‍යය පද යනු උපසර්ග හා නිපාත පදයි.
   iii. අව්‍යය පද යනු වරනැගෙන පදයි.
   iv. අව්‍යය යනු ක්‍රියා විශේෂණ හා නාම විශේෂණ පදයි.

2. අව්‍යය සමාසයේ ප්‍රභේදයක් නො වන්නේ

   i. 'යව්' ආදි ගණය යි.
   ii. 'කු' ආදි ගණය යි.
   iii. 'ප' ආදි ගණය යි.
   iv. 'අභි' ආදි ගණය යි.

3. පහත සඳහන් වාක්‍යවල ඇතුළත් අව්‍යය සමාස පද උපුටා දක්වන්න.

   i. සියල්ලෝ ම සුසිරිතෙහි යෙදිය යුතු බව අවමංගල්‍ය උත්සවය අමතමින් කථිකයා පැවසුවේ ය.
   ii. ගැඹුරු ධර්ම කොටස් ඇතුළත් අභිධර්ම පිටකය ඉසියුම් නැණැසින් විමසිය යුතු ය.
   iii. යහපත් ක්‍රියා නිසා සුප්‍රකට වූ අය මෙන් ම අයහපත් ක්‍රියා නිසා කුප්‍රකට වූ අය ද සමාජයේ සිටිති.
   iv. දැනුම යාවත්කාලීන වීමට නම් නිබඳ ව අධ්‍යයනයන්හි යෙදීම අවශ්‍ය ය.
   v. ප්‍රබල දේශපාලකයකුගේ පිල්මාරුවක් පිළිබඳ නුදුරේදී ම අසන්නට ලැබේ.

4. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

   i. විභක්ති සමාසයට සියලු විභක්ති අයත් වෙයි.
   ii. විභක්ති සමාසයට ප්‍රථමා හා ආලපන විභක්තිවල සම්බන්ධයක් නැත.
   iii. විශේෂණ විශේෂ්‍ය තුල්‍යාධිකරණ අවස්ථාවේ විභක්ති සමාස වෙයි.
   iv. සමාස පදයේ අග පවත්නා විභක්ති ප්‍රත්‍ය අනුව සමාස වර්ගය නම් කෙරේ.

5. පහත සඳහන් සමාස පද කවර විභක්තීන්ට අයත් දැයි නම් කරන්න.

   i. මීපල් -------------------------------------
   ii. පරපුටු -------------------------------------
   iii. මල්මාලය --------------------------------
   iv. සත්ත්වාහාර -----------------------------
   v. මීදුම් ---------------------------------------
   vi. සුරබොජුන් ------------------------------
   vii. දහම්සොඬ -----------------------------

## ක්‍රියාකාරකම iii

1. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

   i. විශේෂණ විශේෂ්‍ය පද එක්ව සෑදෙන සමාසය විශේෂණ සමාසය යි.
   ii. තුල්‍යාධිකරණ විශේෂණ විශේෂ්‍ය එක්වීමෙන් විශේෂණ සමාසය සෑදෙයි.
   iii. භින්නාධිකරණ විශේෂණ විශේෂ්‍යයන් එක් ව විශේෂණ සමාසය සෑදෙයි.
   iv. මුලට විශේෂණ පදයක් එක් ව ඇති සමාසය විශේෂණ සමාසය යි.

2. සම්පූර්ණ කරන්න.

විශේෂණ සමාසය
- 
- 
- 
- 
- සංඛ්‍යා පූර්ව පද

3. පහත සඳහන් විශේෂණ සමාස පද අදාළ වර්ගවලට වෙන් කරන්න.

   ගල්හිත, පාතඹර, පොහොසත්දන, සත්කුළුපව්ව, ගුත්තිලඇදුරු

4. පහත සඳහන් වාක්‍යවල අන්තර්ගත අන්‍යාර්ථ සමාස පද පමණක් උපුටා දක්වා ඒවායෙන් කියැවෙන අන්‍යාර්ථය ද ලියන්න.

   i. ඩෙල්ටා කෝවිඩ් වෛරස ප්‍රභේදය බස්නාහිර ශීඝ්‍රයෙන් පැතිරෙන බවට වෛද්‍යවරු අනතුරු අඟවති.
   ii. ඒ මියුලැසිය යොවුන් සිත් වසඟ කිරීමට සමත් වූවා ය.
   iii. එක් අවස්ථාවක මින්දදයා තිනෙත්හුගේ බැල්මෙන් දැවී ගියේ ය.
   iv. පෙරඹරින් දිනකර නැගෙන විට අවරඹරින් තුසරකර බැස යයි.
   v. වෙසක් පොහෝ දා දශබලධාරීහු මරසෙන් පරදවා බුදු වූහ.

5. දකාරාර්ථ සමාස ක්‍රමයෙන් ගළපා ලියන්න.

   i. ගහ ද වැල ද ---------------------------------
   ii. කැවුම් ද කිරිබත් ද ---------------------------------

iii. පොත් ද පෑන් ද පැන්සල් ද --------------------------------
iv. ඇස් ද ඉස් ද මස් ද ලේ ද නහර ද --------------------------------
v. ඇත් ද අස් ද රිය ද පාබල ද --------------------------------

## පිළිතුරු

### ක්‍රියාකාරකම i

1 සර්ව නාම, සමාස නාම, තද්ධිත නාම, කෘදන්ත නාම

2 -iii

3 විභක්ති සමාසය, විශේෂණ සමාසය, අන්‍යාර්ථ සමාසය, ද්වන්ද්ව සමාසය

### ක්‍රියාකාරකම ii

1 -ii 2- iv

3

i. සුසිරිතෙහි, අවමංගල්‍ය උත්සවය
ii. අභිධර්මය, ඉසියුම්
iii. සුප්‍රකට, අයහපත්, කුප්‍රකට
iv. යාවත්කාලීන, නිබඳ, අධ්‍යයනයන්හි
v. ප්‍රබල, පිළිබඳ, නුදුරේදී ම

4-ii

5 කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අවධි, සම්බන්ධ, ආධාර

### ක්‍රියාකාරකම iii

1- ii

2 විශේෂණ පූර්ව පද, විශේෂණ පර (උත්තර) පද, උපමාන පූර්ව පද, උපමාන පර (උත්තර) පද

3 උපමාන පූර්ව පද, උපමාන පර පද, විශේෂණ පූර්ව පද, සංඛ්‍යා පූර්ව පද, විශේෂණ පර පද

4

i. බස්නාහිර - සූර්යයා බැස යන පළාත
ii. මියුලැසිය - මුව දෙනකගේ බඳු ඇස් ඇති යුවතිය (රූමත් ස්ත්‍රිය)
iii. මින්දදය - අනංගයා, තිනෙත්හු- ඊශ්වර දෙවියා
iv. දිනකර - සූර්යයා, තුසරකර- චන්ද්‍රයා
v. දශබලධාරීහු - බුදුරජාණන් වහන්සේ

5

i. ගහවැල
ii. කැවුම්කිරිබත්
iii. පොත්පැන්පැන්සල්

iv. ඇස්ඉස්මස්ලේනහර
v. ඇත්අස්රියපාබල